# සංක්ෂිප්තය


මෙම අධ්‍යයනය ශ්‍රී ලංකාවේ රජයේ පාසල්වල කනිෂ්ඨ ද්විතීයික ශ්‍රේණිවල (6-9) විෂය සමගාමී ක්‍රියාකාරකම් ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳ අධ්‍යයනයකි. අරමුණු හතරක් පදනම් කර ගනිමින් අධ්‍යයනය සිදු කරන ලදි. කනිෂ්ඨ ද්විතීයික ශ්‍රේණිවල ක්‍රියාත්මක වන විෂය සමගාමී ක්‍රියාකාරකම් හඳුනා ගැනීම, කනිෂ්ඨ ද්විතීයික ශ්‍රේණිවල ක්‍රියාත්මක වන විෂය සමගාමී ක්‍රියාකාරකම් පාසලේ ක්‍රියාත්මක වන ස්වභාවයන් විමසා බැලීම, එම ශ්‍රේණිවල විෂය සමගාමී ක්‍රියාකාරකම් ක්‍රියාත්මක වීමේ දී පාසල මුහුණ දෙන ගැටලු අනාවරණය කර ගැනීම හා කනිෂ්ඨ ද්විතීයික ශ්‍රේණිවල විෂය සමගාමී ක්‍රියාකාරකම් ඵලදායි ලෙස භාවිත කළ හැකි ආකාරය පිළිබඳ සුදුසු යෝජනා ඉදිරිපත් කිරීම අරමුණු වේ.

සමීක්ෂණ පර්යේෂණ ක්‍රමයට අනුව සිදු කළ මෙම අධ්‍යයනයේ දී නියැදිය ලෙස යොදා ගන්නා ලද්දේ මොනරාගල දිස්ත්‍රික්කයේ වැල්ලවාය අධ්‍යාපන කලාපයේ බුත්තල අධ්‍යාපන කොට්ඨාසයේ 1AB, 1C, 2 වර්ගයේ පාසල් තුනක සිසුන් 60 ක්, විදුහල්පතිවරුන් තිදෙනෙක්, නියෝජ්‍ය විදුහල්පතිවරුන් තිදෙනෙක්, ගුරුවරුන් 24 ක් හා ගුරු උපදේශකවරයෙකි. ස්ථරායන සහ සරල අහඹු නියැදි ක්‍රම ඇසුරෙන් නියැදිය තෝරා ගැනීම සිදු විය. නිරීක්ෂණ ෂෙඩියුලයක්, සම්මුඛ සාකච්ඡා නියමාවලි හා ප්‍රශ්නාවලියක් දත්ත රැස්කිරීමේ උපකරණ ලෙස භාවිත කරන ලදි.

මෙම අධ්‍යයනයේ දත්ත විශ්ලේෂණය ප්‍රමාණාත්මක හා ගුණාත්මක යන ක්‍රම දෙකම ඇසුරෙන් සිදු කරන ලදි. රජයේ පාසල්වල කනිෂ්ඨ ද්විතීයික ශ්‍රේණිවල බහුලව ක්‍රියාත්මක වන විෂය සමගාමී ක්‍රියාකාරකම් ලෙස උදෑසන රැස්වීම, ශිෂ්‍ය සමිති හා පරිසර නියමු වැඩසටහන් බවට අනාවරණය කර ගැනිණි. තවද වෙස්, කැරම් ආදි ක්‍රියාකරකම් මෙම පාසල් වර්ග තුනේ ම ක්‍රියාත්මක නොවන බව අනාවරණය කර ගත හැකි විය. මෙම අධ්‍යයනයෙන් 1AB පාසල තුළ උදෑසන රැස්වීම සතිපතා ක්‍රියාත්මක වුවද 1C හා 2 වර්ගයේ පාසල් තුළ දිනපතා ක්‍රියාත්මක වන බව අනාවරණය විය. සීල සමාදාන වැඩසටහන්, බාලදක්ෂ, ක්ෂේත්‍ර අධ්‍යාපන චාරිකා, බිත්ති පුවත්පත් ආදිය අධ්‍යයනය සඳහා යොදා ගත් පාසල්වල මධ්‍යස්ථ මට්ටමින් ක්‍රියාත්මක වන බව අනාවරණය විය. විෂය සමගාමී ක්‍රියාකාරකම් ක්‍රියාත්මක වීමේ දී පාසල මුහුණ දෙන ගැටලු අතරින් භෞතික සම්පත්වල හිඟ බව, කාලය ප්‍රමාණවත් නොවීම, පුහුණු ගුරුවරුන් හිඟ බව, ආර්ථික දුෂ්කරතා බලපාන බව අධ්‍යයනයේ තුන්වන අරමුණට අදාළ ව අනාවරණය කර ගත හැකි විය.

කනිෂ්ඨ ද්විතීයික ශ්‍රේණිවල විෂය සමගාමී ක්‍රියාකාරකම් ඵලදායි ලෙස භාවිත කළ හැකි ආකාරය පිළිබඳ යෝජනා ඉදිරිපත් කිරීම අධ්‍යයනයේ අවසාන අරමුණ විය. විෂය සමගාමී ක්‍රියාකාරකම් පිළිබඳ දැනුම යාවත්කාලීන කර ගැනීම ගුරුවරුන්ට ඉදිරිපත් කරන ලද යෝජනාවකි. විෂය සමගාමී කටයුතු පිළිබඳ ගුරුවරුන්ට අවශ්‍ය පුහුණුව ලබාදීම, පාසල තුළ විෂය සමගාමී ක්‍රියාකාරකම් වැඩි ආකර්ෂණයක් ලැබෙන පරිදි ක්‍රියාත්මක කිරීම විදුහල්පතිවරුන්ට ඉදිරිපත් කළ යෝජනාය. මානව හා භෞතික සම්පත් නිසියාකාරව ලබා දීම, රැකියා ලබාදීමේ දී විෂය සමගාමී කටයුතු කළ සිසුන් සඳහා ප්‍රමුඛත්වයක් ලබාදීම ආදිය මෙම අධ්‍යයනය මගින් අධ්‍යාපනඥයන් හා ප්‍රතිපත්ති සම්පාදකයන් සඳහා ඉදිරිපත් කරන ලද යෝජනාවන් ය.

# ABSTRACT

This study has attempted to study how the co -curricular activities are implementing in the Junior secondary (6-9) government schools in Sri Lanka. The study was conducted base on four objectivies. The four objectivies were, identify the co-curricular activities that are implementing in the Junior secondary classes; examine the status and how the co- curricular activities are implementing in the the Junior secondary classes; reveal the difficulties which school have to be faced when implementing co-curricular activities and propose suitable suggestion to use co–curricular activities effectively for Junior secondary classes.

The study was conducted according to the survey research design. The sample of the study consisted of 60 students who learn in three types of schools (1AB, 1C and Type 2) ; 03 principals, 03 vise-principals ; 24 teachers and one Inservice –Adviser in Buttala Education Division attached to Wellawaya Education Zone in the Monaragala District. The sample was selected by using stratification and simple random sample methods. Data collection Instruments that used for the study were observation schedule, Interview schedule and Questioner.

In this study data was analyzed by using both Quantitave and Qualitative methods. It was revealed that, morning assembly, student's literary Association and Environmental programme are implementing mostly as co–curricular activities in Junior secondary classes in the government schools.

The study revealed that chess and carrom was not implemented in all types of schools in the sample. Further, the study revealed 1AB school was conducted morning assembly weekly but 1C and type 2 schools were conducted it daily. Scarcity of physical resource is the main problem which schools have to face when conducting co–curricular activities was identified. Further it was revealed under third objective that lack of physical resources, lack of time, economical problems and lack of trained teachers are the common problems which have to face when implementing co-curricular activities.

Last objective of the study was propose suitable suggestions how to use co-curricular activities effectively. Suggestion for the teachers are upgrading knowledge and gaining train on co-curricular activities. Arranging training for teachers regarding this activities is the suggestion proceed to principals. Provide enough human and physical resources, given priority for students who gain co- curricular activities when providing jobs are the suggestions proceeded to educators and policy makers from this study.